බද්දේගම ප්‍රාදේශීය සභාව
ගාල්ල දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 04 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට බද්දේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් ශේෂය රු.6,195,139 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.3,857,925 ක් ලෙස දක්වා තිබීමෙන් ණයහිමියන් රු.2,337,214 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ලැබිය යුතු මූලධන ආධාර රු.15,927,113 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර හා ණයගැතියන් රු.15,927,113 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.17,492,861 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.7,230,293 ක් ලෙස ප්‍රතිපාදන සලසා තිබීමෙන් ප්‍රාග්ධන වියදම් හා ණයහිමියන් රු.10,262,568 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ශේෂය රු.4,744,664 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.4,600,379 ක් ලෙස දක්වා තිබීමෙන් ණය ශේෂය රු.144,285 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) වැටුප් ප්‍රතිපූර්ණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.18,087,501 ක් සියළුම වැඩසටහන් අතර විභජනය නොකර, එක් වැඩසටහනක් යටතේ දක්වා තිබුණි.

(ඊ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු.94,216 ක් වූ වරිපනම් බදු සහ රු.2,505 ක් වූ අක්කර බදු කලින් ලැබීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල නොදක්වා, හිඟ බදු ශේෂයන්ගෙන් අඩුකර දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද රු.122,487 ක් වූ ප්‍රාග්ධන වියදම් මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 03 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.322,763 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) පාලන ගිණුම් අනුව ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය රු.14,721,292 ක් වුවද, ඊට අදාළ උපයෝගී ලේඛන තුලනය කර නොතිබූ හෙයින් පාලන ගිණුම්වල ශේෂයන් උපයෝගී ලේඛන ශේෂයන් සමඟ සැසඳිය නොහැකි විය.

**1.3.4 අවිනිශ්චිත ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,581,230 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන ගිණුම් ගැලපීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.80,414,599 ක් වූ ගනුදෙනු සම්බන්ධව ඔප්පු, පිඹුරුපත්, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, විධිමත්ව පවත්වාගෙන යනු ලබන ණයහිමි හා ණයගැති ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථ සහතික පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,278,506 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.2,192,716 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

--------------------

**2.2.1 හිඟ ආදායම්**

---------------

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතු රු.2,533,084 ක් වූ වරිපනම් බදු, රු.21,233 ක් වූ අක්කර බදු සහ රු.509,370 ක් වූ බදුකුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 296,917 ක උසාවි දඩ හා රු. 8,207,381 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ විධිවිධාන අනුව සභාපතිවරයා සහ සභා මන්ත්‍රීවරුන් 14 දෙනෙකු විසින් 2013 වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ විගණන දිනය වූ 2014 පෙබරවාරි 17 දින වනවිටද නිසි බලධාරියා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිරවුල් නොකල ගිණුම්**

වසර 06 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.510,673 ක් වූ ගිණුම් ශේෂ 03 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) අගරු චෙක්පත්**

වර්ෂ 05 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පැවතුණ රු.27,256 ක් වූ අගරු චෙක්පතක් වූ 2014 ජුනි මාසය දක්වාත් නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 සමන්තැන්න වත්ත ඉඩම් වෙන්දේසිය**

නාගරික සංවර්ධන අධිකාරියට අයත් බලප්‍රදේශයක් වූ වල්පිට ග්‍රාම සේවා නිලධාරී වසමේ පිහිටි අක්කර 08 යි රූඩ් 02 යි පර්චස් 9.2 ක් වූ සමන්තැන්න වත්ත, පුද්ගලික සමාගමක් විසින් කැබලි 92 කට කොටස් කර තිබූ අතර, සභාව විසින් 2013 සැප්තැම්බර් 02 දින සංවර්ධන බලපත්‍රය ලබා දී තිබුණි.

මේ පිළිබඳව 2014 පෙබරවාරි 12 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යාක්ෂ ජනරාල් විසින් 2008 දෙසැම්බර් 16 වන දින නිකුත් කල අංක: 05/02/1/384 දරන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි සෑම අනු බෙදුමක් සඳහා ම පළමු බිම් කොටසට රු.1,000 ක් සහ ඉතිරි බිම් කොටස්වලට රු.500 බැගින් සභාවට මුදල් ගෙවා අනුකූලතා සහතිකයක් ලබා ගතයුතු විය. 2014 පෙබරවාරි මාසය වන විට ඉඩමෙහි කැබලි 03 ක් හැර ඉතිරි කැබලි සියල්ල විකුණා තිබුණ ද, අනුකූලතා සහතිකය ලබාගෙන නොතිබූ හෙයින් රු.46,500 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ii) 1992 සැප්තැම්බර් 30 දිනැති අංක: 3/2/1/10(ii) දරන නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාගේ චක්‍රලේඛය අනුව හෙක්ටයාර් 01 කට වැඩි සෑම අනු බෙදීමකින්ම වීථි අත්හැරීමෙන් පසු ඉඩමේ ප්‍රමාණයෙන් 10% කට නොඅඩු

ප්‍රමාණයක් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා සුදුසු ස්ථානවලින් වෙන්කල යුතුව තිබුණි. ඒ අනුව වෙන්දේසි කරන ලද අක්කර 7 යි රූඩ් 1 යි පර්චර්ස් 25.6 ක් වූ ඉඩම් ප්‍රමාණයෙන් සභාවට දිය යුතු 10% ක ප්‍රමාණය රූඩ් 2 යි පර්චස් 32.41 ක් වුවද, සභාවට ලබාගෙන තිබූ ප්‍රමාණය රූඩ් 2 යි පර්චස් 21.6 ක් බව විගණනයේදි අනාවරණය විය. එමෙන්ම සභාවට ලබා දී තිබූ කොටස ඉඩමේ කෙළවරේ පිහිටි බෑවුම් සහිත ප්‍රයෝජනයට ගත නොහැකි ස්ථානයක වූ බවත් විගණනයේදි වැඩිදුරටත් නිරික්ෂණය විය.

### 3.4 අවිධිමත් ගනුදෙනු

-----------------------

(i) 2006 ජනවාරි 25 දිනැති අංක 08 හා 2006 මාර්තු 01 දිනැති අංක 09 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව සභා අරමුදලින් රු.436,950 ක් ගෙවා කාර්යාල පරිශ්‍රය තුල සිසිටිවි කැමරා පද්ධතියක් සවි කිරිමට අදාල උපකරණ මිලදි ගැනිම සිදුකර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපයෝගී ලේඛනවල/උපලේඛන වල දැක්වෙන ශේෂයන්ට ලෙජර් ගිණුම් ශේෂයන් සමාන කිරීම සඳහා රු.6,482,650 ක් වූ ආදායම් සමුච්චිත අරමුදලට ගැලපුම් කර තිබුණි.

### 3.5 හඳුනාගත් අලාභ

-------------------

1985 අංක 01 දරන (සංශෝධන) පනතින් සංශෝධනය වූ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වැනි වගන්තිය අනුව සභාවේ සේවය කළ ආදේශක හා අනියම් සේවකයන් වෙනුවෙන් නියමිත පරිදි දායක මුදල් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් අධිභාර ලෙස රු.22,380 ක් සභා අරමුදලින් සේවක අර්ථසාධක අරමුදල වෙත ගෙවා තිබුණි.

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 210(2) ප්‍රකාරව ගෙවීම් ප්‍රමාද කිරීම හේතු කොටගෙන කිසියම් ගාස්තුවක් ගෙවීමට සිදු වුවහොත් ඒ පිළිබඳ වගකිවයුතු නිලධාරීන්ගෙන් එම ගාස්තු අයකර ගතයුතු වුවද, සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය